කෘෂිකර්ම අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : අංක 182

ආයතනයේ නම : කෘෂිකර්ම අමාත්‍යාංශය

කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු /කාරක සභාව විසින් දෙන ලද නියෝග	**කම්ටුව විසින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට / නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගත් ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය**
01. රසායනික පොහොර භාවිතය අත් හිටුවීම. **රසායනික පොහොර භාවිතය අත් හිටුවීමෙන් පසුව නිෂ්පාදනය මෙන්ම වගා කරන ලද බිම් ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවීම.**	
2021 වර්ෂයේ සමස්ත සහල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් ලක්ෂ 33 ක් පමණ වුවත්, 2022 වර්ෂයේ සහල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් ලක්ෂ 16 ක් පමණ වේයැයි උපකල්පනය කර ඇති බව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. මෙය 2021 වර්ෂයේ සමස්ත සහල් නිෂ්පාදනයට සාපේක්ෂව 50% ක පමණ අඩුවීමක් බව ද ඔහු ප්‍රකාශ කළේය. ශ්‍රී ලංකාවේ වාර්ෂික සහල් අවශ්‍යතාවය මෙට්‍රික් ටොන් ලක්ෂ 24 ක් පමණ වන බැවින් 2022 වර්ෂයේ සහල් අවශ්‍යතාවයෙන් මෙට්‍රික් ටොන් ලක්ෂ 8 ක පමණ අඩුවක් ඇතිවිය හැකි බව ද ප්‍රකාශ කළේය.	"දේශගුණික විපර්යාසයන්ට තිරසර විසඳුම් සහිත හරිත සමාජ-ආර්ථික රටාවක් කරා" මැයෙන් වූ අංක 21/0746/301/013 හා 2021-04-27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, රසායනික පොහොර භාවිතය අත්හිට වූ අතර, ඒ අනුව, 2021/22 මහ කන්නයේ වී වගාවට පරිසර හිතකාමී පොහොර සහ ස්වභාවික බනිජ පොටෑසියම් ක්ලෝරයිඩ් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ප්‍රසම්පාදනය කර ගොවීන්ට ලබාදීමට කටයුතු කරන ලදි. 2022 යල කන්නය සඳහා පරිසර හිතකාමී පොහොරවලට අමතරව ඉන්දියානු එක්සිම් බැංකුවේ ණය මුදල් වලින් ආනයනය කළ යූරියා පොහොර 50 Kg ක මිටියක් රු. 10,000 මිලකට ගොවීන් වෙත නිකුත් කිරීමට කටයුතු කර ඇත. තව ද, පොස්පරස් ශාක පෝෂක අවශ්‍යතාවය සැපයීම පිණිස එප්පාවල රොක් පොස්පේට් ලබා දීමට කටයුතු කරන ලදි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති දත්ත අනුව 2021/22 මහ කන්නයේ වී වගාවේ 37% ක අස්වැන්නේ අඩුවීමක් ද, 2022 යල කන්නයේ 23% ක අස්වැන්නේ අඩුවීමක් ද වාර්තා වී ඇත.

එච්.කේ.ඒ. රංජිත් උදයසිරි
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ගුණදාස සමරසිංහ
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

02. කෘෂිකර්ම අමාත්‍යාංශය සතුව නිවැරදි දත්ත නොමැතිවීම.

කෘෂිකර්ම අමාත්‍යාංශය සතුව නිවැරදි දත්ත නොමැතිවීම හා කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීන් මගින් නිවැරදි තොරතුරු ලබා ගැනීමට කටයුතු නොකිරීම.

අමාත්‍යාංශය සතු දත්ත 100% ක් නිවැරදි නොවන බව තමන් පිළිගන්නා බව ප්‍රකාශ කළ ප්‍ර.ග.නි. අමාත්‍යාංශය ඇස්තමේන්තු කරන සම්පූර්ණ බිම් ප්‍රමාණය වගා නොකිරීමත්, පොහොර සහනාධාරය ලබා ගැනීම සඳහා ඇතැම් ගොවීන් ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර තිබෙන නිසා ඊට අනුව අස්වැන්න ගණනය කිරීමත් මෙම තත්ත්වයට හේතු වී ඇති බව ප්‍රකාශ කළේය.

මෙම ප්‍රශ්නය නිවැරදි කිරීම සඳහා කටයුතු කරමින් පවතින බව ප්‍රකාශ කළ ප්‍ර.ග.නි. මේ වන විට " GEO ගොවියා" නමින් පරිගණක යෙදුමක් (APP) හඳුන්වා දී ඇති බවත්, එළඹෙන මහ කන්නයට පෙර වගා බිම් පිළිබඳ නිවැරදි දත්ත ලබාගැනීමට බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කළේය.

9000 ක් පමණ වන කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීන්ගෙන් වැඩි පිරිසකට ක්ෂේත්‍රය පිළිබඳ මූලික දැනුම නොමැති බවත්, අදාළ ඩිප්ලෝමා පාඨමාලාව සපුරා ඇත්තේ 1200 ක පමණ පිරිසක් බවත් මෙහි දී අනාවරණය විය.

<u>නිර්දේශ</u>

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ඇතුළු අදාළ සියළුම ආයතන සමග ඒකාබද්ධව කෘෂිකර්මයට අදාළ තොරතුරු ලබා ගැනීම සම්බන්ධයෙන් 2022 යල කන්නයේ පොහොර බෙදා දීමේ දී පූර්වයෙන් තොරතුරු රැස් කර ඒ අනුව පොහොර බෙදා හැරීමට කටයුතු කරන ලද අතර, 2022/23 මහ කන්නය සඳහා තොරතුරු නිවැරදිව රැස්කොට අවශ්‍ය ගණනය කිරීම් සිදු කර ඇත. මේ වන විට බඩ ඉරිභූ වගා කරන ගොවීන් මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචි කිරීම සිදු කරමින් පවතින බවද දන්වා සිටිමි. අදාල වගාබිම් ඩිජිටල් ක්‍රමයට මැන ඒ අනුව තොරතුරු යාවත්කාලීන කිරීමට කටයුතු කරන බැවින් ඉදිරියේ දී ලබාදෙන තොරතුරු වල නිරවද්‍යතාවය තව දුරටත් ඉහළ යනු ඇත.

එමෙන්ම, කෘෂිකාර්මික දත්ත හා තොරතුරු විධිමත්ව, නිවැරදිව කඩිනමින් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම හා සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනය හා තීරණ ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ කෘෂිකර්ම අමාත්‍යාංශය ප්‍රමුඛ අවධානය යොමු කොට ඇත.

ඒ අනුව මේ සඳහා මේ වන විට පියවර රාශියක් ගෙන ඇති අතර ඉන් ප්‍රමුඛ පියවරක් ලෙස Bill & Melinda Gates Foundation (BMGF) හා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය එක්ව "Inclusive Digital Transformation of Sri Lankan Agriculture" යන වැඩසටහන ආරම්භ කර ඇත. මෙය පස් අවුරුදු සැළැස්මක් වන අතර අදියර දෙකකින් යුතුව ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇත. මෙහි ප්‍රථම අදියර මේ වන විට ආරම්භ කර ඇති අතර එමඟින් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ඇතුළු සියළුම ආයතන වල තම විෂය පථයන් සඳහා මේ වන විට භාවිතයේ ඇති දත්ත පද්ධතීන් ද, දැනට එකතු කරමින් පවතින කෘෂි දත්ත ද අධ්‍යයනය කොට සියළුම දත්ත පද්ධතීන් එකතු කර ගනිමින් ඒකාබද්ධ මාර්ගගත දත්ත පද්ධතියක් සකස් කිරීමේ මූලික කටයුතු සිදු කරමින් පවතී.

එච්.කේ.ඒ. රංජිත් උදයසිරි
ප්‍රධාන මුල්‍ය නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
උත්තමල්වත්ත පටුමග, බත්තරමුල්ල

විධිමත් වැඩපිළිලිවෙලක් සකස් කර මසක් ඇතුළත කාරක සභාව හමුවට ලිඛිතව ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ට නියෝග කළේය.	මෙය පහත අදියර කිහිපයක් ඔස්සේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. දැනට මෙම ව්‍යාපෘතිය පහත පරිදි ක්‍රියාත්මක වේ. 1. කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ රැස්වීම් 5 ක් පවත්වා අවශ්‍යතා හඳුනා ගැනීම, දැනට නිර්මාණය කර ඇති දත්ත පද්ධතීන් හඳුනා ගැනීම, දත්ත පද්ධති වල හා කෘෂි තොරතුරු වල ඇති පරතරය හඳුනා ගැනීම. 2. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමඟ එක්ව ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අවශ්‍ය ජාත්‍යන්තර සම්මතයන් හඳුනා ගැනීම සහ ඒ අනුව කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ තොරතුරු එක් රැස් කිරීම සඳහා රාමුවක් නිර්මාණය කිරීම. මෙහි දෙවන අදියර වශයෙන් ඩිජිටල් කෘෂිකාර්මික සැළැස්මක් ගොඩනැඟීම ඉදිරියේදී සිදු කිරීමට නියමිතව ඇත. ඒ අනුව මේ වන විටත් “Geo Goviya” දත්ත පද්ධතිය කෘෂි මෙහෙයුම් කටයුතු සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරනු ලබයි. ඒවා නම්, • ගොවීන් සඳහා පොහොර සහනාධාරය ලබාදීම. • කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර සඳහා ඉන්ධන සහනාධාරය ගොවීන්ට ලබාදීම. • ආසියානු සංවර්ධන බැංකුව ඇතුළු අනිකුත් ආයතන මඟින් ක්‍රියාත්මක වන "ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය නැවත නගා සිටුවීමේ සහයෝගිතා ණය ආධාර වැඩසටහන" යටතේ ගොවීන් සඳහා ණය ආධාර (cash grant) ලබා දීම, ආදිය වේ. එමෙන්ම, කාරක සභාවේ දී අනාවරණය වූ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ගනිමින් පවතින බව දැනුම් දෙමි. ➢ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්ගේ රාජකාරී කටයුතු විධිමත්ව ඉටු කිරීම සඳහා, රාජකාරී ලැයිස්තු සංශෝධනය කිරීම හා නව කාර්යයසාධන ඇගයීම් ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කරමින් පවතින බවත්,

එච්.කේ.ඒ. රංජිත් උදයසිරි
ප්‍රධාන මුල්‍ය නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

- කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් අභිප්‍රේරණය කිරීම සම්බන්ධයෙන් හා ඔවුන්ගේ වගකීම සම්බන්ධයෙන් වන උපදෙස් මාලාවක් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් වෙත යොමු කිරීමට කටයුතු කර ඇති බවත්,

- කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් සහ අනිකුත් නිලධාරීන් සඳහා පහත සඳහන් පුහුණු වැඩසටහන් පවත්වනු ලැබූ බවත් දැනුම් දෙමි.

අදාළ පුහුණු වැඩසටහනෙහි නම	සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව	පුහුණු ලාභීන්ගේ තනතුරු නාමය
ක්ෂුද්‍ර මූල්‍ය හඳුන්වා දීම	160	• සහකාර කොමසාරිස් • ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන් • ඩිප්ලෝමාධාරී කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් • ගොවිජන සේවා මධ්‍යස්ථාන කළමනාකරණ සහකාර නිලධාරීන් • කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර
ක්ෂුද්‍ර මූල්‍ය ගිණුම් තැබීම	160	
ක්ෂ්ද්‍ර මූල්‍ය ණය සුරැකුම් අරමුදල	160	
ගෙවතු වගාව	400	
හිඟ ණය අය කර ගැනීම සඳහා ගොවිජන විනිශ්චය සභාවට ලිපිගොනු ඉදිරිපත් කිරීම	70	
ගොවි බැංකු ප්‍රතිපත්ති ප්‍රකාශන සකස් කිරීම	25	

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ඇති ඩිප්ලෝමාධාරී කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් සංඛ්‍යාව පහත දක්වා ඇත.

එච්.කේ.ඒ. රංජිත් උදයසිර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

කෘෂිකර්ම අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය",
වත්ත පටුමග, බත්තරමුල්ල.

ඩිප්ලෝමාධාරී කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් සංඛ්‍යාව

	දිස්ත්‍රික්කය	පළමු අවුරුද්ද	දෙවන අවුරුද්ද	එකතුව
1	කොළඹ	4	14	18
2	ගම්පහ	8	19	27
3	කළුතර	15	56	71
4	නුවර	23	26	49
5	මාතලේ	9	22	31
6	නුවරඑළිය	7	54	61
7	ගාල්ල	15	189	204
8	මාතර	9	1	10
9	හම්බන්තොට	59	95	104
10	කුරුණෑගල	6	0	59
11	හලාවත	0	10	16
12	අනුරාධපුර	5	0	0
13	පොළොන්නරුව	2	18	23
14	බදුල්ල	2	87	89
15	මොණරාගල	2	24	26
16	රත්නපුර	10	64	74
17	කෑගල්ල	14	81	95
18	අම්පාර	2	20	22
19	වව්නියාව	0	0	0
20	මුලතිව්	0	0	0
21	කිලිනොච්චි	0	0	0
22	මඩකලපුව	1	0	1
23	මන්නාරම	0	0	0
24	ත්‍රිකුණාමලය	1	0	1
25	යාපනය	1	0	1
	එකතුව	**202**	**780**	**982**

Ry Achchi

එච්.කේ.ඒ. රංජිත් උදයසිරි
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ගුණදාස සමරසිංහ
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

03. ආහාර අර්බුදයට මුහුණදීම සඳහා පියවර.
වත්මන් ආර්ථික අර්බුදය හමුවේ නුදුරු අනාගතයේ ඇතිවේ යැයි අනතුරු ඇඟවීම් කර ඇති ආහාර අර්බුදයට මුහුණදීම සඳහා අමාත්‍යාංශය දැනටමත් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඉදිරියේ දී ගැනීමට අපේක්ෂා කරන පියවර.

කඩිනම් ක්‍රියාමාර්ගයක් ලෙස යල කන්නයේ අස්වැන්න වැඩිකර ගැනීම සඳහා අවශ්‍ය පොහොර, කෘමිනාශක හා වල් නාශක ආදිය ලබාදීමට කටයුතු කළ බවත්, කාබනික පොහොරවලට අමතරව යූරියා ලබාදීම සඳහා මේ වන විට කටයුතු කරගෙන යන බවත්, යූරියා මෙට්‍රික් ටොන් 65,000 ක් ඇණවුම් කර ඇති බවත් ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය.	වත්මන් ආර්ථික අර්බුදය හමුවේ නුදුරු අනාගතයේ ඇතිවේ යැයි අනතුරු ඇඟවීම් කර ඇති ආහාර අර්බුදයට මුහුණදීම සඳහා අමාත්‍යාංශය දැනටමත් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඉදිරියේදී ගැනීමට අපේක්ෂා කරන පියවර පහත පරිදි වේ. 2022/23 මහ කන්නයේ වී වගාව සඳහා ශාක පෝෂක අවශ්‍යතාවයෙන් 70% ක් රසායනික පොහොර මගින් සැපයීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශ කර ඇත. ඒ අනුව 2022/23 මහ කන්නය සඳහා ලෝක බැංකු ණය යටතේ යූරියා මෙ.ටො. 107,000 ක් ආනයනය කර 2023-02-13 දිනය වන විට මෙ.ටො. 94,079 ක් ගොවීන් වෙත අලෙවි කර ඇත. 2022/23 මහ කන්නය සඳහා යූරියා 50 Kg බෑගයක සහනාධාර මිල රු. 10,000.00 ක් විය. තව ද MOP පොහොර මෙ.ටො. 41,876 ආනයනය කර ඇති අතර, 50 Kg බෑගයක් රු. 19,500.00 ක මිලකට ගොවීන් වෙත අලෙවි කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව 2023-02-13 දින වන විට ගොවීන් විසින් MOP පොහොර මෙ.ටො. 2,125 ක් මිලදී ගෙන ඇත. හෙක්ටයාර 1 ක් සඳහා රු. 20,000.00 ක වටිනාකමින් යුත් පරිසර හිතකාමී පොහොර ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් ගොවීන් වෙත නොමිලයේ සැපයීමට ද කටයුතු කර ඇත. ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිත ආයතනයේ (USAID) හා මීට අමතරව, එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) ආධාර යටතේ 2022/23 මහ කන්නය සඳහා නොමිලයේ යූරියා මෙ.ටො. 10,562,047 ක් ගොවීන් වෙත බෙදා දී ඇත. එසේම, 2023 යල කන්නයේ වී වගාව සඳහා ද ශාක පෝෂක අවශ්‍යතාවයෙන් 70% ක් රසායනික පොහොර මගින් සැපයීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශ කර ඇත. ඒ අනුව 2023 යල කන්නය සඳහා යූරියා, MOP සහ TSP අවශ්‍යතාව පිළිවෙලින් මෙ.ටො. 75,000, 20,000 සහ 18,000 ක් වේ. මේ වන විටත් අවශ්‍ය MOP ප්‍රමාණය සහ යූරියා මෙ.ටො. 25,000 ක් රජයේ

එච්.කේ.ඒ. රංජිත් උදයසිරි
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

	පොහොර සමාගම් සතුව ඇත. තවත් යූරියා මෙ.ටො. 25,000 ක් ප්‍රසම්පාදනය කිරීමට පියවර ගෙන ඇත. ත්‍රිත්ව සුපර් පොස්පේට් (TSP) පොහොර මෙ.ටො. 36,000 ක් ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිත ආයතනයේ (USAID) හා එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) ආධාර යටතේ නොමිලයේ මාර්තු මාසයේ දී මෙරටට ලැබීමට නියමිත ය. මීට අමතරව අමාත්‍යාංශය විසින් වගා කටයුතු සාර්ථක කර ගැනීමට අදාල පහත සඳහන් කරුණු ද ඉටුකිරීමට ද කටයුතු කර ඇති බව සඳහන් කරමි. **සියළුම කෘෂිකාර්මික කටයුතු සඳහා ග්ලයිපොසේට් වල්නාශකය භාවිතයට අවසර ලබා දීම.** • සංයෝජිත වර්ගීකරණ කේත අංක (HS Codes) 2ක් යටතේ මෙරටට ග්ලයිපොසේට් ආනයනය සඳහා වූ බාධකය ඉවත් කරන ලදී. • බලපත්‍ර සහිත නිෂ්පාදනයක් ලෙස සහ තේ සහ රබර් වගාවේ වල් මර්දනය සඳහා අත්‍යවශ්‍ය වල්නාශකයක් ලෙස වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි 2018.10.02 දිනැති අංක 2091/13-2018 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් සීමිත භාවිතය යටතේ **පොලිඔක්සිඑතලීන් ඒමයින් (POEA)** නැමති සහකාරක රහිත ග්ලයිපොසේට් භාවිතා කිරීමටත් ආනයනයටත් ඉඩ ලබා දෙන ලදී. • රටේ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීමත් ,ගොවියාගේ ආර්ථික තත්වය ඉහළ දැමීමත් රජයේ මූලික අරමුණක් වූ මෙම අවස්ථාවේ ,ගොවියාට පහසුවෙන් වල් මර්දනය කරගෙන වැඩි අස්වැන්නක් ලබා ගැනීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික නිර්දේශවලට අනුකූලව තේ ,රබර් සඳහා පමණක් වූ මෙම POEA රහිත ග්ලයිපොසේට් වල්නාශකය අනෙකුත් සියළුම බෝගවල වල් මර්දනය සඳහාද භාවිතයට අවසර ලබා දෙමින් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් විසින් **2022.11.17** දින නිකුත් කළ අංක **49/2306** දරණ ගැසට් පත්‍රය මඟින් විධිමත් නියාමන ක්‍රමවේදයකට යටත්ව ග්ලයිපොසේට් ආනයනයට සහ භාවිතයට අවසර ලබා දෙන ලදී.

එච්.කේ.ඒ. රංජිත් උදයසිරි
ප්‍රධාන මුල්‍ය නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

- ග්ලයිපොසේට් ආනයනය සඳහා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හා පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි වී ඇති පෞද්ගලික අංශයේ පළිබෝධනාශක ආනයනකරුවන්ට අවසර ලබා දුන් අතර දැනට මෙම වල්නාශකය වෙළෙඳපොළට ලැබෙමින් පවතී.

ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය නැවත නගා සිටුවීමේ සහයෝගීතා ණය සහ ආධාර .

- Support for Farmers යන ව්‍යාපෘතිය යටතේ ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දුන් ප්‍රතිපාදන මඟින් මහ කන්නයේ බීම් සැකසීම ආරම්භ කළ ගොවීන් සඳහා හෙක්ටයාරයකට රු.10,000.00 ක් බැගින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා 2023 අප්‍රේල් මාසය වනවිට ගොවීන් 1,055,209 වෙත රු. 7,475,844,611.00 ක මුදලක් ලබා දී තිබේ.

- එසේම ,ආසියානු සංවර්ධන බැංකුව මඟින් ලංකා බැංකුව ,මහජන බැංකුව ,ජාතික ඉතිරි කිරීමේ බැංකුව ,සහ ග්‍රාමීය සංවර්ධන බැංකුව හරහා පොලී රහිත සහනදායී ගෙවීමේ පදනම යටතේ ණය මුදලක් ගොවීන් වෙත ලබා දීමේ කටයුතු සිදු කරමින් පවතී.

අත්‍යවශ්‍ය පළිබෝධනාශක ආනයනය සඳහා පැවති බාධක ඉවත් කිරීම.

- 2021 වර්ෂයේ පුරවැසියන්ට **"වස විස නැති ආහාර"** සඳහා ඇති අයිතිය සහතික කිරීමේ අරමුණින් 2021-05-06 දිනැති හා අංක 2226/48 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පළිබෝධනාශක ආනයනය තහනම් කරන ලදි.

- ඉන් පසු නැවත 2021.11.30 දිනැති හා අංක 2256/ 23 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පළිබෝධනාශක සලාක ක්‍රමයක් යටතේ ආනයනය කිරීම සඳහා අවසර ලබා දීමට කටයුතු කර ඇත.

- වර්තමානයේ රටේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා වැඩි අස්වැන්නක් ලබා ගැනීමට, පළිබෝධ උවදුරු මර්දනය කර පහසුවෙන් වගා කිරීමට අවශ්‍ය පළිබෝධනාශක ආනයනය කිරීමට බාධාවක් වූ සලාක ක්‍රමය ද ඉවත් කර පහසුවෙන් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් හරහා අවශ්‍ය පළිබෝධනාශක ආනයනය කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත.

එච්.කේ.ඒ. රංජිත් උදයසිරි
ප්‍රධාන මූල්‍ය නිලධාරි
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

පිටපත් සැකසූ
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
"ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල

	• ඒ අනුව, 2023.01.01 වන විට කෘමිනාශක කිලෝ ලීටර 496,356 ක්, දිලීර නාශක කිලෝ ලීටර 518,065 ක් හා වල් නාශක කිලෝ ලීටර 798,339 ක ප්‍රමාණයක් ආනයනය කර ඇති අතර, මෙම ප්‍රමාණය 2023 යල කන්නය සඳහා ප්‍රමාණවත් වෙනු ඇත.

එච්.කේ.ඒ. රංජිත් උදයසිරි
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ගුණදාස සමරසිංහ
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

04. කාබනික පොහොර ප්‍රමිතිය සහ සැපයුම්කරුවන්ට ගෙවන මුදල.
යල කන්නය සඳහා ගොවීන්ට ලබාදුන් කාබනික පොහොර ප්‍රමිතියෙන් තොර බවට ගොවීන්ගෙන් චෝදනා එල්ල වන බව ප්‍රකාශ කළ කාරක සභාව, කාබනික පොහොර කි. ග්‍රෑ. එකක් සඳහා සැපයුම්කරුවන් ගෙවන මුදල පිළිබඳව සිය අවධානය යොමු කළේය.

කාබනික පොහොර සඳහා මුදල් ගෙවනු ලබන්නේ එහි අඩංගු නයිට්‍රජන් සංයුතියට අනුව බවත්, කාබනික පොහොර කි. ග්‍රෑ සඳහා ගෙවන ලද අවම මුදල රුපියල් 41 ක් බවත් ප්‍ර.ග.නි./ග.නි ප්‍රකාශ කළේය. **<u>නිර්දේශ</u>** පවතින තත්ත්වය යටතේ වගා කටයුතු සඳහා ජනතාව තුළ විශාල උනන්දුවක් දක්නට ලැබෙන බැවින් ඒ සඳහා අවශ්‍ය **<u>බීජ සහ ප්‍රමිතියෙන් යුත් පොහොර සැපයීමට</u>** අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම. මෙම අර්බුදය හමුවේ විවිධ සංවිධාන මගින්ද වගා වැඩසටහන් ක්‍රියාත්මක කරන බැවින් එම සංවිධාන අමාත්‍යාංශය තුළ ලියාපදිංචි කිරීමේ වැඩපිළිවෙලක් සකස් කිරීම	❖ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් කාබනික පොහොර වලට අදාල ප්‍රමිතීන් මේ වන විට සකසා ඇත. **(ඇමුණුම අංක 01)** අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව ඒකාබද්ධව ඉදිරිපත් කරන ලද 2022-02-23 දිනැති රැස්වීම් වාර්තාවට අනුව 2022 යල කන්නය සඳහා ප්‍රසම්පාදනය කළ කාබනික පොහොර කි. ග්‍රෑ 01 ක් සඳහා සැපයුම් කරුවන්ට ගෙවන මිල එම නිෂ්පාදනයේ අඩංගු නයිට්‍රජන් ප්‍රතිශතය අනුව තීරණය කර ඇත. ඒ අනුව, ඉහත සඳහන් කළ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටු වාර්තාවේ **(ඇමුණුම අංක 02)** අනු අංක 03 යටතේ කාබනික පොහොර කි. ග්‍රෑ 01 ක් සඳහා මිල තීරණය කර ඇති ආකාරය පහත පරිදි වේ.

එච්.කේ.ඒ. රංජිත් උදයසිරි
ප්‍රධාන මුල්‍ය නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ගුණදාස සමරසිංහ
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ආහාර අර්බුදයට කෙටි කාලීන පිළියම් ලෙස පහත සඳහන් පියවර මේ වන විට ගෙන ඇති බව ප්‍ර.ඇ.නි ප්‍රකාශ කළේය.

මෙම වර්ෂයේ පරිභෝජනයට හිහවේ යැයි ඇස්තමේන්තු කර ඇති සහල් ප්‍රමාණය ආනයනය කිරීමට කටයුතු කරන ලෙස වෙළඳ අමාත්‍යාංශය දැනුවත් කිරීම.

"එක්ව වවමු- රට දිනවමු" තේමාව යටතේ කඩිනම් වගා සංග්‍රාමයක් දියත් කිරීම.

Type of Fertilizer	Percentage of Nitrogen (N%)	Mean Value (LKR)	Transport and Administrative cost (LKR)	Determined Unit Price with Transport an Administrative cost (LKR)
Compost	1.5 - 2.5	33.71	8	41
	2.6 - 3.5	43.3		51
	3.6 - 4.5	53		61
	4.6 - 5.5	63		71
	5.6 - 6.5	73		81
	6.6 - 7.5	83		91

ඉහත තීරණ ඇතුළත් කර ඉදිරිපත් කරන ලද 2022-03-09 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2022-03-16 දිනැතිව අනුමැතිය ලැබී ඇති බව ද සඳහන් කරමි.

❖ **ප්‍රමිතියෙන් යුතු බීජ සැපයීම.**

එමෙන්ම, 2022/23 මහ කන්නයේ බීජ සුලභතාවය ඇති කිරීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පහත පියවර ගෙන ඇත.

1. එළවළු බීජ සැපයීම.

1. ගෙවතු බීජ පැකට් මිලියන 2.5 ක් සැපයීම.
II. එළවළු මූලික බීජ සැපයීම්.

රට තුළ බණ්ඩක්කා, පතෝල, කරවිල, මෑ, රාබු, තක්කාලි, මාළු මිරිස්, වැටකොළු, පිපිඤ්ඤා, වම්බටු, බෝංචි යන බෝගවල සහතික බීජ නිෂ්පාදනය සඳහා අවශ්‍ය සම්පූර්ණ මූලික බීජ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සපයනු ලැබේ.

එච්.කේ.ඒ. රංජිත් උදයසිරි
ප්‍රධාන මුල්‍ය නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ගුණදාස සමරසිංහ
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

සපයන ලද මූලික බීජ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

බෝගය	සැපයූ මූලික බීජ ප්‍රමාණය (kg)	අපේක්ෂිත බීජ අස්වැන්න (kg)
බණ්ඩක්කා	154.3	21383
පතෝල	67	7313
කරවිල	7.3	450
මෑ	198.75	7636
රාබු	45	6567
තක්කාලි	1.53	270.85
මාළුමිරිස්	2.6	412.5
වැටකොළු	30	2820
පිපිඤ්ඤා	1.6	554
බෝංචි	25	500
වම්බටු	0.1	50

එච්.කේ.ඒ. රංජිත් උදයසිරි
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"

ගුණදාස සමරසිංහ
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

III, එළවළු සහතික බීජ සැපයීම.

බෝගය	වගා වපසරිය (ha)	බීජ අවශ්‍යතාවය (Mt)	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සැපයූ ප්‍රමාණය (Mt)	කෘ.දෙ.සැපයූ ප්‍රමාණය ජාතික අවශ්‍යතාවයේ ප්‍රතිශතයක් ලෙස
බණ්ඩක්කා	4400	19.8	1.7907	9.04%
පතෝල	1400	5.6	0.3579	6.39%
කරවිල	2500	15	0.4415	2.94%
මෑ	4500	90	2.6017	2.89%
රාබු	1800	9	0.4561	5.07%
තක්කාලි	3600	1.08	0.1852	17.15%
මාළුමිරිස්	2100	2.1	0.0791	3.77%
වැටකොළු	3000	9	0.0665	0.74%
පිපිඤ්ඤා	2000	2	0.1268	6.34%
බෝංචි	4500	225	4.4152	1.96%
වම්බටු	6150	1.525	0.1400	9.18%

බීජ වී සැපයීම.

- 2022/23 මහ කන්නය සඳහා සහතික බීජ වී බුසල් 1,981,660 ක් (මෙම කන්නයේ බීජ වී අවශ්‍යතාවයෙන් 79.26% ක්) නිපදවීම සඳහා අවශ්‍ය ලියාපදිංචි බීජ වී බුසල් 49,541.5 ක් 2022 යල කන්නයේ නිකුත් කර ඇත.

- සහතික බීජ වී බුසල් 14,292 ක් 2022/23 මහ කන්නය සඳහා නිකුත් කර ඇත.

එච්.කේ.ඒ. රංජිත් උදයසිරි
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ගුණදාස සමරසිංහ
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

අතිරේක ආහාර බෝග බීජ සැපයීම;

- දේශීයව නිපදවනු ලබන සහතික බීජ සඳහා සම්පූර්ණ මූලික බීජ අවශ්‍යතාවය සපුරනු ලබන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන මූලික බීජ මඟිනි.

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සෘජුවම සපයන ලද සහතික බීජ ප්‍රමාණයන් පහත පරිදි වේ.

බෝගය අතිරේක ආහාර බෝග	වගා වපසරිය (ha)	බීජ අවශ්‍යතාවය (Mt)	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සැපයූ ප්‍රමාණය (Mt)	කෘ.දෙ.සැපයූ ප්‍රමාණය ජාතික අවශ්‍යතාවයේ ප්‍රතිශතයක් ලෙස
මුං	17000	425	139.600	32.85%
උඳු	15000	375	134.425	35.85%
කව්පි	11000	385	35.685	9.27%
රටකජු	12000	1200	106.624	8.89%
සෝයා	300	15	24.438	100%
කුරක්කන්	4800	34	5.892	17.33%
තල	3250	23	4.237	18.42%
බඩඉරිඟු (විවෘත පරාගික)	1700	34	49.520	100%
බඩඉරිඟු (දෙමුහුන්)	83300	1250	12.102	0.97%
මිරිස් ((විවෘත පරාගික)	5000	5	0.783	15.67%
මිරිස් (දෙමුහුන්)	5000	2.5	0.197	7.89%

" එක්ව වවමු- රට දිනවමු" තේමාව යටතේ කඩිනම් වගා සංග්‍රාමයක් දියත් කිරීමට අදාලව පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

1. වගා නොකල ඉඩම් හඳුනාගෙන වගාව සඳහා යොමුකිරීම, ගෙවතු වගාවට උනන්දු කිරීම සඳහා ගෙයින් ගෙට ගොස් ජනතාව දැනුවත් කිරීම සඳහා ග්‍රාමීය මට්ටමේ නිලධාරීන් පස් දෙනෙකුගෙන් සමන්විත

එච්.කේ.ඒ. රංජිත් උදයසිරි
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ගුණදාස සමරසිංහ
...ාංශය
...න්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

අංක. 80/5,

	කමිටුවක් මඟින් අවශ්‍ය කටයුතු සිදුකිරීම, කාබනික පොහොර නිෂ්පාදනය සඳහා අවශ්‍ය සහනාධාර ලබාදීම, ඒ සඳහා තාක්ෂණික දැනුම කෘෂි ව්‍යාප්ති සේවාව මඟින් ලබාදීම, වන සත්ව හානි අවම කිරීමට අවශ්‍ය ඇතැම් ක්‍රමෝපායන් හඳුන්වාදීම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය මඟින් අවශ්‍ය මූලික බීජ නිෂ්පාදනය කිරීම මඟින් එම බීජ අවශ්‍යතාවය තහවුරු කරලීම. 2. වී ඇතුළු අතිරේක ආහාර බෝග 12 ක් සඳහා ඉහත 1 හි දක්වන ලද ඇතැම් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම මඟින් රටකජු, තල, උඳු, කව්පි වැනි බෝග ස්වයංපෝෂිත තත්ත්වයට ආසන්න වූ අතර, පෙර වසර වලට සාපේක්ෂව ආනයන ප්‍රමාණය හා වියදම ඉතාමත්ම සීමිත තත්ත්වයකට පත්කර ගැනීමට හැකිවිය. බෝග වර්ග 04 කට අදාළව වසර 05 ක් තුල සිදුකරන ලද ආනයන පිලිබඳ දත්තයන් **ඇමුණුම් 03** මඟින් ඉදිරිපත් කර ඇත.. 3. ප්‍රමිතිගත කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සඳහා ක්‍රම ආදර්ශන, ක්ෂේත්‍ර දින, ගොවි පුහුණු, විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මඟින් දැනුවත් කිරීමේ වැඩසටහන්, මහා හා මධ්‍ය පරිමාණ කාබනික පොහොර නිෂ්පාදකයන්ට අවශ්‍ය ප්‍රතිපාදන හා යන්ත්‍රෝපකරණ ලබාදීම, ඒ සඳහාම කටයුතු කරන තිරසාර කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන ආයතන මඟින් නව කාබනික පොහොර වර්ග නිපදවීමේ තාක්ෂණික ක්‍රම එළිදැක්වීමට ව්‍යාප්ති අංශය දායකවීම. 4. රසායනික පොහොර බීජ නොමිලයේ ලබාදීම (බඩඉරිගු වැනි) කෘෂිකර්ම ව්‍යාප්ති ක්‍රමය ශක්තිමත් කිරීමට අවශ්‍ය කටයුතු පුළුල් කිරීම තුළින් වැඩි වපසරියක බෝග වගාකිරීමට ගොවීන් පෙළඹවීමට හැකිවිය.

එච්.කේ.ඒ. රංජිත් උදයසිරි
ප්‍රධාන මුල්‍ය නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ගුණදාස සමරසිංහ
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

05. වගා කිරීම සඳහා රජය සතු ඉඩම් ලබාදීම.

රජයට අයත් වගා නොකළ, වනජීවී හා වනසංරක්ෂණ නොවන වාරි පහසුකම් සහිත ඉඩම් වගා කිරීම සඳහා ජනතාවට ලබාදීමට බලාපොරොත්තුවන බව ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය.

<u>නිර්දේශ</u>

වගා කිරීම සඳහා ඉඩම් ලබාදීමේ දී තනි පුද්ගලයින්ට නොව ග්‍රාමීය කමිටු/ප්‍රාදේශීය කමිටු අනුව ලබාදීම වඩාත් යෝග්‍ය බව.

දක්ෂිණ අධිවේගී මාර්ගය දෙපස තිබෙන අක්කර දහස් ගණනක රක්ෂිත ඉඩම් මඤ්ඤොක්කා, බතල, ගහල වැනි වගාවන් සඳහා යොදාගැනීමට

මෙම වැඩසටහන නිසි කාල රාමුවකට හා සැලසුමකට අනුව පෙළගැස්වීම හා පසු විපරම් කිරීම.

" වගා කිරීම සඳහා රජය සතු ඉඩම් ලබාදීම" යන තේමාවට අදාලව ඉදිරි කටයුතු සිදුකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

සුදුසු ආයතන මගින් රජයේ ආයතනවලට අයත් වගා නොකළ එහෙත් වගා කිරීමේ විභවයක් සහිත ඉඩම් හඳුනාගෙන, ග්‍රාමීය/ප්‍රාදේශීය කමිටු වෙත එම ඉඩම් ලබාදීමෙන් පසු අදාළ ඉඩම්වල ස්වභාවය හා ඉඩම් පවතින ප්‍රදේශ අනුව සුදුසු වගාවන් හා වගා ක්‍රම හඳුන්වාදීම සඳහා තාක්ෂණික දායකත්වය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ලබා දේ.

මේ සම්බන්ධ වගකීම් දරණ අදාළ ආයතන මඟින් දැනට සබරගමුව, බස්නාහිර, ඌව වැනි පළාත් වල අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇති අතර, වගාවන් සඳහා අවශ්‍ය තාක්ෂණය හා රෝපණ ද්‍රව්‍ය ලබාදීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම ව්‍යාප්ති සේවාව සක්‍රීයව යෙදවීමට සැලසුම් සකස් කර ඇත.

❖ **දුම්රිය රක්ෂිත ඉඩම් වගා කටයුතු සඳහා යොදා ගැනීම.**

දුම්රිය රක්ෂිත ඉඩම් වගා කටයුතු සඳහා තාවකාලික පරිහරණයට ලබාගැනීම සම්බන්ධයෙන් අදාල දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කරන ලදි. උතුරු දුම්රිය මාර්ගයේ ඉදිකිරීම් මේ වන විට ආරම්භ වී ඇති බැවින්, එකී දුම්රිය රක්ෂිතවල වගා කටයුතු සිදු කළ නොහැකි බව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් විසින් අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත.

තාවකාලික බෝග වගාවන් සඳහා දුම්රිය රක්ෂිත ඉඩම් කෙටිකාලීනව බදු දීම සඳහා ඉල්ලුම්පත් කැඳවුවද, ඒ සඳහා කිසිවෙකු ප්‍රතිචාර දක්වා නොමැති බව රත්නපුර දිස්ත්‍රික් ලේකම් විසින් අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත.

එච්.කේ.ඒ. රංජිත් උදයසිරි
ප්‍රධාන මුල්‍ය නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ගුණදාස සමරසිංහ
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

	පුත්තලම දිස්ත්‍රික්කයේ දුම්රිය රක්ෂිත ඉඩම් වගා කටයුතු සඳහා ලබාදීමට අදාලව 2023 අප්‍රේල් මාසය වන විට ඉල්ලීම් 03 ක් ලැබී ඇති බවත්, එම ඉල්ලීම් ත්‍රිත්වය දුම්රිය දෙපාර්තමේන්තුවේ අදාල ආයතන වෙත යොමු කර ඇති බවත් පුත්තලම දිස්ත්‍රික් ලේකම් විසින් අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. කුරුණෑගල දිස්ත්‍රික්කයේ දුම්රිය රක්ෂිත ඉඩම් වගා කටයුතු සඳහා ලබාදීමට අදාලව 2023 ජනවාරි මාසය වන විට ඉල්ලීම් 108 ක් ලැබී ඇති බවත්, එම ඉල්ලීම් අතුරින් ඉල්ලීම් 70 ක් දුම්රිය දෙපාර්තමේන්තුවේ අදාල ආයතන වෙත යොමු කර ඇති බවත් කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් විසින් අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. තාවකාලික බෝග වගාවන් සඳහා දුම්රිය රක්ෂිත ඉඩම් කෙටි කාලීනව බදු දීම සඳහා තම දිස්ත්‍රික්කය තුළ නොමැති බව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් විසින් අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. වී, බඩඉරිඟු, රටකජු, කවුපි, උඳු, මුං, මඤ්ඤොක්කා යන බෝග අක්කර 1,176 ක මේ වන විටත් වගා කර ඇති බව වවුනියා දිස්ත්‍රික් ලේකම් විසින් අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මේ වන විටත් දුම්රිය රක්ෂිත ඉඩම් තුළ වගා කටයුතු සිදු වන බවත්, එම ඉඩම්වලට පරිභාහිරව වෙනත් වගා කළ හැකි ඉඩම් නොමැති බවත් පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් විසින් අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පමණක් වගාවන් සඳහා සුදුසු දුම්රිය රක්ෂිත ඉඩම් බැවින්, එකී ඉඩම් වගා කිරීමට සිදු කළ ඉල්ලීම් 32 ක් 2023 අප්‍රේල් මාසය වන විට අදාල ආයතන වෙත යොමු කර ඇති බව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් විසින් අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. ගම්පහ දිස්ත්‍රික්කයේ දුම්රිය රක්ෂිත ඉඩම් වගා කටයුතු සඳහා ලබාදීමට අදාලව 2023 ජනවාරි මාසය වන විට ඉල්ලීම් 25 ක් ලැබී ඇති බවත්, එම ඉල්ලීම් අතුරින් ඉල්ලීම් 23 ක් දුම්රිය දෙපාර්තමේන්තුවේ අදාල ආයතන වෙත යොමු කර ඇති බවත් ගම්පහ දිස්ත්‍රික්

එච්.කේ.ඒ. රංජිත් උදයසිරි
ප්‍රධාන මුල්‍ය නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ගුණාදාස සම්පරසිංහ
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

	ලේකම් විසින් අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. අක්කර 55 ක් වූ දුම්රිය රක්ෂිත ඉඩම් අතුරින් අක්කර 9.2375 ක ප්‍රමාණයක වී, එළවළු බෝග මේ වන විට වගා කර ඇති බව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් විසින් අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. එමගින් පුද්ගලයින් 27 ක් ප්‍රතිලාභය ලබන බව ද දක්වා ඇත. ❖ **දක්ෂිණ අධිවේගී මාර්ගය දෙපස තිබෙන අක්කර දහස් ගණනක රක්ෂිත ඉඩම්, වගාවන් සඳහා යොදා ගැනීම.** මේ සම්බන්ධයෙන් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයෙන් විමසීමක් සිදු කරනු ලැබීය. ➢ දක්ෂිණ අධිවේගී මාර්ගය මං තීරු 06 ක් සහිතව ඉදිකිරීම සඳහා පවරා ගත් රක්ෂිත භූමිය තුළ මඤ්ඤොක්කා, බතල, ගහල වැනි සතුන් පරිභෝජනය කරන බෝග වගා කිරීමෙන් සතුන් අධිවේගී මාර්ග සීමාව තුළට පැමිණීමේ අවධානමක් පැවතීම. ➢ අධිවේගී මාර්ගය දෙපස මිනිස් පරිභෝජනයට සුදුසු වගාවන් සිදු කිරීමෙන් අධිවේගී මාර්ග දැල් වැට සහ අධිවේගී මාර්ග දේපළවලට හානි සිදුවීම සහ මාර්ගයට අනවසරයෙන් මිනිසුන් ප්‍රවේශ වීමේ අවධානමක් පැවතීම. යන කරුණු හේතුවෙන් මාර්ග ආරක්ෂාවට දැඩි බලපෑමක් ඇතිවන බැවින්, මෙම කාර්යය ඉටුකිරීමට නෛතික හැකියාවක් නොමැති බව මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දී ඇති බව ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් දැනුම් දී ඇත.

එච්.කේ.ඒ. රංජිත් උදයසිරි
ප්‍රධාන මුල්‍ය නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය".
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

06. තිරිඟු පිටි හිඟයක් සඳහා විකල්පය.
තිරිඟු පිටි හිඟයක් ඇති වුවහොත් සහල් සඳහා ඇති ඉල්ලුම ඉහළ යා හැකි බැවින් ඒ සඳහා ඇති විකල්පය.

හිඟ සහල් ප්‍රමාණය ආනයනය කිරීමේ කටයුතු වෙළඳ අමාත්‍යාංශය විසින් සැලසුම් සහගතව කරගෙන යනු ලබන බවත්, තිරිඟු පිටි හිඟයක් ඇති වුවහොත් ඊට විකල්පයක් ලෙස මඤ්ඤොක්කා, බතල, වැනි වගාවන් ප්‍රවර්ධනය කරන බවත් ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය.	තිරිඟු පිටි වලට විකල්ප ලෙස මඤ්ඤොක්කා, බතල වැනි බෝග ප්‍රවර්ධනය සඳහා පහත වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. 1. "එක්ව වවමු - රට දිනවමු" ආහාර බෝග නිෂ්පාදන ජාතික සංග්‍රාමය - 2022 යටතේ රෝපණ ද්‍රව්‍ය හුවමාරු වැඩසටහන් ආයතන මට්ටමින් සහ ග්‍රාමීය කමිටු මට්ටමින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් සිදුකිරීම. 2. පසුගිය වසරේ එළිදැක්වූ ඇතැම් කෘෂි තාක්ෂණයන් (හාල් මල්ලේ බතල වගාව වැනි නව තාක්ෂණ) ක්‍රමවේද තුළින් ගොවීන් වෙත යොමුකර ක්‍රියාත්මක කරවීම. 3. අස්වැන්න හා ගුණාත්මයෙන් ඉහළ ප්‍රභේද නිදහස් කිරීම හා එම ප්‍රභේද ප්‍රචලිත කරවීම.

එච්.කේ.ඒ. රංජිත් උදුයසිරි
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ගුණදාස සමරසිංහ
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

07. ජනතාව දැනුවත් කිරීම.	
<u>නිර්දේශ</u> කෘෂිකර්ම අමාත්‍යාංශය පිළිබඳව මහජන විශ්වාසය කඩ වී ඇති බැවින් මෙම අර්බුදකාරී අවස්ථාවේ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩපිළිවෙල හා එහි ප්‍රගතිය සම්බන්ධයෙන් දෙසතියකට වරක් හෝ මාධ්‍ය මගින් ජනතාව දැනුවත් කිරීමට කටයුතු කිරීම.	මේ පිළිබඳ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගුවන් විදුලි, රූපවාහිනී, 1920 කෘෂි උපදේශන සේවය, ග්‍රැෆික් සන්නිවේදනය, තොරතුරු තාක්ෂණ මෙවලම් (Facebook, You tube වැනි) කෘෂි තාක්ෂණ උද්‍යාන පවත්වාගෙන යාම ආදී මාධ්‍ය මගින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු වේ. මීට අමතරව, මේ පිළිබඳ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් දැනට ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන ඇමුණුම 04 මඟින් ඉදිරිපත් කර ඇත.

එච්.කේ.ඒ. රංජිත් උදයසිරි
ප්‍රධාන මුල්‍ය නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ගුණතිලක සමරසිංහ
කෘෂිකර්ම අමාත්‍යාංශය
"ගොවිජන මන්දිරය",
අංක.80/5,
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

08. මහ කන්නය සඳහා බීත්තර වී.

මහ කන්නය සඳහා අවශ්‍ය බීත්තර වී ප්‍රමාණය සපයා ගැනීම.

සමස්ථ වගා වපසරිය අනුව එක් කන්නයකට බීත්තර වී බුසල් ලක්ෂ 40 ක් පමණ අවශ්‍ය වුවත්, වී වගාවේ දී වසර 04 කට වරක් බීජ මාරු කිරීම සිදු කිරීම ප්‍රමාණවත් බැවින් මුළු වගා වපසරියෙන් 25% ක් සඳහා පමණක් බීත්තර වී සැපයිය යුතු බව ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය. ඒ අනුව මහ කන්නය සඳහා බීත්තර වී බුසල් ලක්ෂ 10ක් අවශ්‍ය බවත්, කෘෂිකර්ම දෙපාර්තමේනතුව සතුව බුසල් 80,000 ක ප්‍රමාණයක් පවතින බවත්, ඉතිරි ප්‍රමාණය වෙනත් පාර්ශවයයන්ගෙන් ලබා ගැනීමට හැකියාව ඇති බවත් ප්‍රකාශ කළේය.

<u>නිර්දේශ</u>

ගොවිජන කේන්ද්‍ර අනුව මහ කන්නය සඳහා බීත්තර වී ලබා දෙන ක්‍රම වේදය මසක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කිරීමට ප්‍ර.ග.නි වෙත නිර්දේශ කිරීම.

මහ කන්නය සඳහා අවශ්‍ය බීත්තර වී ප්‍රමාණය සපයා ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග මේ වන විටත් ගෙන ඇත.

1.රාජ්‍ය හා පුද්ගලික අංශ සඳහා සහතික බීජ වී නිෂ්පාදනයට අවශ්‍ය මූලික බීජ වී සැපයීම.

2. කොන්ත්‍රාත් බීජ වී නිෂ්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

3. ස්වයං බීජ වී නිෂ්පාදනය සඳහා අවශ්‍ය මූලික බීජ සැපයීම.

4. වගා ලියාපදිංචි කිරීම හා බීජ සහතික කිරීම.

5. බීජ නිෂ්පාදන තාක්ෂණය ලබාදීම.

2022/23 මහ කන්නය සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය අන්තර් පළාත් ව්‍යාප්ති බල ප්‍රදේශ, පළාත් කෘෂිකර්ම බල ප්‍රදේශ, මහවැලි ගොවිපළවල් හා මහවැලි බල ප්‍රදේශවල ගොවීන් විසින් සහතික බීජ වී බුසල් 275,000 ක් පමණ නිපදවා ඇති අතර, බීජ වී බුසල් 750,000 ක් පමණ පුද්ගලික අංශය මඟින් ඔවුන්ගේ ගුණාත්මය තහවුරු කිරීමේ ක්‍රමවේද යටතේ නිපදවා නිකුත් කර ඇත.

ඒ අනුව ගුණත්වය තහවුරු කල බීජ වී බුසල් 1,000,000 ක් පමණ 2022/23 මහ කන්නය සඳහා නිකුත් වී ඇත. **(ඇමුණුම 05)**

එච්.කේ.ඒ. රංජිත් උදයසිරි
ප්‍රධාන මුල්‍ය නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ගුණදාස සමරසිංහ
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

09. බීජ ආනයනය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගැනීම	
දෙමුහුන් බීජ ආනයනය සඳහා ඩොලර් මිලියන 10 ක පමණ මුදලක් අවශ්‍ය වන බවත්, එම මුදල ලබාගැනීම සඳහා සහයෝගය ලබාදෙන ලෙසත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි කාරක සභාවෙන් ඉල්ලීමක් කළේය. **<u>නිර්දේශ</u>** මෙය ඉතා අත්‍යවශ්‍යම කරුණක් බැවින් කාරක සභාවේ නිර්දේශය මත මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමුඛතා පදනම මත ලබාගැනීමට භාණ්ඩාගාර ලේකම් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි වෙත නියෝග කළේය.	දෙමුහුම් බීජ ආනයනය සඳහා ඩොලර් මිලියන 10 ක පමණ මුදලක් අවශ්‍ය වන බවත්, එම මුදල ලබාගැනීම සඳහා සහයෝගය ලබාදෙන ලෙසත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර .ග .නි කාරක සභාවෙන් ඉල්ලීමක් කළේය. • 2022 වසරේ මැද භාගයේ, රටේ පැවතුණු ඩොලර් අර්බුදය කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ආනයනික බීජ හා රෝපණ ද්‍රව්‍ය සඳහා ද දැඩි බලපෑමක් ඇති කළේය . • ඒ හේතුවෙන් බීජ හා රෝපණ ද්‍රව්‍ය සංගමයේ පෞද්ගලික සමාගම් සඳහා දෙමුහුම් බීජ ආනයනය කිරීමට මහ බැංකුව හරහා ප්‍රතිපාදන ලබා දීමට කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් විසින් ඩොලර් මිලියන 10ක් ඉල්ලා ඇත. • ඒ අනුව බීජ හා රෝපණ ද්‍රව්‍ය සංගමයේ ආනයනකරුවන්ට ඩොලර් අර්බුදය පැවතුණු දුෂ්කර කාලයේදී ඩොලර් මිලියන 5කට ආසන්න ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබා දීමට කටයුතු කර ඇත. • එසේම, බීජ හා රෝපණ ද්‍රව්‍ය සංගමය විසින් නැවතත් ඩොලර් මිලියන 5කට ආසන්න ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉල්ලූ නමුත්, ඩොලර් ගැටළුව තරමක් දුරට විසඳුනු බැවින් එම මුදල ලබා දීම සඳහා කටයුතු කිරීම අවශ්‍ය නොවීය.

එච්.කේ.ඒ. රංජිත් උදයසිරි
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය".
රජමල්වත්ත පටුමග. බත්තරමුල්ල

ගුණදාස සමරසිංහ
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක.80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග. බත්තරමුල්ල.

ඇමුණුම 01

ඇමුණුම	01
[illegible]	01
Annexure	01

Quality Standard for organic fertilizer

1. Standard for compost (SLS 1635:2019, UDC 628.477.3)

General requirements

Colour

The colour of the material shall be brown, grey or dark black.

Keeping properties

The material shall comply with the requirements specified in this standard, after storage in packages/containers as prescribed in clause 6 at room temperature for not less than12 months from the date of production.

Moisture content

The material shall not contain more than 25 per cent of moisture by dry mass, when tested as prescribed in **SLS 645 ; Part 2.**

Odor

The material shall be free from any foul odor.

Texture

The texture of the material shall be friable when moist.

Physical Requirements

The product shall also comply with the physical requirements given in Table 1 when tested in accordance with the relevant methods given in Column 4 of the table.

TABLE 1 - Physical Requirements

Sl No. (1)	Characteristics (2)	Requirement (3)	Method of test (4)
i)	pH	6.5 – 8.5	SLS 1526: 2016
ii)	Conductivity,dsm *max.*	4.0	Appendix B
iii)	Foreign matter	Free from visible non biodegradable materials except sand	Appendix H
iv)	Sand content percent by		

	mass on dry basis, max	20	Appendix E
v)	Particle size; Residue particles when passing through 4 mm sieve, percent by mass, max.	2	Appendix G

Chemical Requirements

The product shall comply with the chemical requirements given in Table 1 when tested in accordance with the relevant methods given in Column 4 of the table.

TABLE 2- Chemical Requirements

Sl No.	Characteristics	Requirement	Method of test
(1)	(2)	(3)	(4)
i)	Total Nitrogen content as N , per cent by dry mass, min.	1.0	SLS 645: Part 1
ii)	Total Phosphate content as P_2O_5 per cent by dry mass, min.	0.5	SLS 645: Part 5
iii)	Total Potassium content as K_2O as per cent, by dry mass, min.	1.0	SLS 645 :Part 4
iv)	Total Magnesium content, as MgO per cent by dry mass, min.	0.5	SLS 645: Part 6
v)	Total Calcium content, as CaO per cent by dry mass, min.	0.7	SLS 645: part 6
vi)	Organic Carbon ,as C per cent, by dry mass, min.	20	Appendix C
vii)	C:N ratio	10-25	Appendix D

CamScanner

Microbiological requirements

The material shall comply with the microbiological limits as prescribed in Table 3 when tested in accordance with the relevant methods given in Column 4 of the table.

TABLE 3 – Microbiological Requirements

Sl. No. (1)	Characteristic (2)	Requirement (3)	Method of test (4)
i)	Faecal coli forms colonies (MPN)/ g on dry weight basis,	Free	SLS 516 : Part 3
ii)	Salmonella per (MPN)/ 25 g on dry weight basis	Free	SLS 516 : Part 5

Limits for potentially toxic elements

The product shall not exceed the limits for potentially toxic elements given in Table 4.

TABLE 4 – Limits for potentially toxic elements

Sl. No. (1)	Potentially toxic element (2)	Requirement (3)	Method of test (4)
i)	Cadmium content, mg/kg dry weight, max.	3	2.6.35 AOAC Method 2006
ii)	Chromium content, mg/kg dry weight, max.	50	
iii)	Lead content, mg/kg dry weight, max.	50	
iv)	Mercury content, mg/kg dry weight, max.	0 5	
v)	Nickel content, mg/kg dry weight, max.	50	
vi)	Arsenic content, mg/kg dry weight, max.	3	

Biological Requirements

The material shall not contain more than 16 viable seeds per square meter when tested with methods prescribed in Appendix F.

CamScanner

PACKAGING

Compost shall be packed in sound and strong packages or containers. If polypropylene /woven or not, bags with an inner lining of low density polyethylene having a minimum thickness 50 µm or any other material with barrier properties superior (High Density Polyethylene) or equal to low density polyethylene of 50 µm thickness to afford maximum protection from normal hazard of transportation and handling. While those weighing 5 kg or less shall, be packed in polyethylene bag with a suitable thickness suitable packages include polypropylene, bags of mass 5-50 kg.

NOTE : *The material may also be supplied in bulk containers as agreed between the purchaser and the supplier.*

MARKING AND LABELLING

The bags shall legibly and indelibly marked with the following information and shall comply with Fertilizer Act and regulations in Sri Lanka.

The bags shall legibly and indelibly mark with the following information:

a. Name and type of the product;
b. Name and address of the manufacturer, including country of origin;
c. Brand name and/or trade mark, if any;
d. Date of manufacture ;
e. Net mass in kilograms
f. Instructions for storage and use;
g. Date of Expiry;
h. Batch No;
J Total Nitrogen to total dry mass in percent by mass;
k Total Phosphorus (P_2O) to total dry mass; percent by mass
l Total Potassium (k_2O) to total dry mass percent by mass;
m Total Organic Carbon (C) to total dry mass percent by mass ;
n C:N ratio; and
o The statement "Use no hooks".

CamScanner

Standard for liquid organic fertilizer

Chemical and physical requirements

The product shall conform to the requirements given in Table 1, when tested according to the methods given in Column 4 of the Table 1.

TABLE 1 – Chemical and physical requirements for liquid organic fertilizers

SI No. (1)	Characteristic (2)	Requirement (3)	Method of test (4)
i)	pH*	6.0-8.5	SLS 1526
ii)	Electrical conductivity*, dS/m, max.	20	DSLS ISO 11265
iii)	Total Nitrogen content as N, per cent by mass, min.	1.0	SLS 645: Part 1
iv)	Total Potassium content as K_2O, per cent by mass, min.	0.5	SLS 645: Part 4
v)	Total Phosphorus content as P_2O_5, per cent by mass, min.	0.5	SLS 645: Part 5
vi)	Total primary nutrient, ($N+ P_2O_5+ K_2O$) per cent by mass, min	2.0	SLS 645: Part 1, SLS 645: Part 4, SLS 645: Part 5
vii)	Organic carbon per cent by mass, min.	5.0	Appendix B

* *Mentioned the dilution factor in the test report.*

Microbiological requirements

The product shall not exceed the microbiological limit given in Table 2 when tested according to the method prescribed in Column 4 of the Table 2.

TABLE 2 – Microbiological limits for liquid organic fertilizers

SI No. (1)	Test organism (2)	Limit (3)	Method of test (4)
i)	Faecal *coliform* MPN, per ml	Absent	SLS 516: Part 3
ii)	*Salmonella*, per 25 ml	Absent	SLS 516: Part 5

Requirement for limits of potentially toxic elements

CamScanner

The product shall not exceed the limits for potentially toxic elements given in Table 3, when tested as prescribed in Column 4 of the Table 3.

TABLE 3 - Limits for potentially toxic elements for liquid organic fertilizers

Sl No. (1)	Elements (2)	Limit, mg/kg (maximum) (3)	Method of test (4)
i)	Arsenic, as As	0.5	AOAC 2006.03
ii)	Cadmium, as Cd	0.5	
iii)	Chromium, as Cr	0.5	
iv)	Lead, as Pb	1.0	
v)	Mercury, as Hg**	0.5	

***EPA 7473 can be used as alternative method for Hg determination.*

PACKAGING

The product shall be packaged in sound and strong compatible bottles, containers or packages. Suitable packaging materials include plastic or glass or any other non-rusty materials. The product may also be supplied in bulk containers agreed upon between the purchaser and the vendor.

MARKING AND/ OR LABELLING

The following shall be marked or labelled legibly and indelibly on each bottle or package:

a) Name of the product as "Liquid Organic Fertilizers";
b) Name and address of the manufacturer, packer or distributor;
c) Registered trade mark if any;
d) Batch or code number;
e) Net content in metric units;
f) Date of manufacture;
g) Date of expiry;
h) Primary nutrient content;
k) Crops for which it is intended;
m) Dilution ratio/ Instructions for use; and
n) Storage/disposal instructions;

CamScanner

(57)

කොම්පෝස්ට් පොහොර මෙ.වොන් 10ක් සඳහා දළ වියදම් ඇස්තමේන්තුව :-

ඉක්‍රොයිලර් අතුරුහුව (ට්‍රැක්ටර් ලෝඩ්)	08	- රු. 80,000.00
හණකොළ (ට්‍රැක්ටර් ලෝඩ්)	10	- රු. 15,000.00
රතිල කොළ (ට්‍රැක්ටර් ලෝඩ්)	10	- රු. 20,000.00
කෝග අවශේෂ (ට්‍රැක්ටර් ලෝඩ්)	02	- රු. 12,000.00
එස්සාවල රෝක් පොස්පේට් (කි.ග්.)	500	- රු. 8,000.00
අමු ද්‍රව්‍ය සඳහා වියදම්		= රු. 135,000.00

වෙනත් වියදම් :-

ඉන්ධන ඩීසල් ලීටර් 25	- රු. 15,000.00
කළු පොලිතීන් කි.ග්. 20	- රු. 9,000.00
කුම්කරු ශ්‍රමය 1500 × 30	- රු. 45,000.00
විදුලි බිල	- රු. 5,000.00
වෙනත් වියදම්	- රු. 6,000.00
නොඩහැඟිලි/යන්ත්‍ර සූත්‍ර ක්ෂය	- රු. 5,000.00
	= රු. 80,000.00

ඇසුරුම් රහිත මුළු පිරිවැය	- රු. 215,000.00
කි.ග්. එකක් සඳහා පිරිවැය	- රු. 21.50

COPY

CamScanner

MINUTES OF THE JOINT TECHNICAL EVALUATION COMMITTEE AND STANDING CABINET APPOINTED PROCUREMENT COMMITTEE MEETING

Nature of the Procurement Committee	Standing Cabinet Appointed Procurement Committee	**Name of the Procurement Entity**	On behalf of the Procurement Entities CFC Ltd. and CCF Ltd, State Ministry of Promoting the Production & Regulating the Supply of Organic Fertilizer, and Paddy & Grains, Organic Foods, Vegetables, Fruits, Chillies, Onion and Potato Cultivation Promoting, Seed Production and Advanced Technology Agriculture
Title of the Procurement		Procurement of Eco-friendly Fertilizer Locally manufactured Fertilizer for Yala – 2022 SMA/Proc/EFF/2022/Yala	
Meeting No. 02	**Date:** 23.02.2022	**Purpose** Consideration of the TEC report dated 21.02.2022 and price negotiation and finalization of the awarding prices.	

PRESENT

	Members of the SCAPC		Capacity
1	Eng. Ivan De Silva	Secretary Ministry of Irrigation	Chairman
2	Mr. D.M.L. Bandaranayake	Secretary Ministry of Agriculture	Member
3	Mr. M.N. Ranasinghe	Secretary, State Ministry of Promoting the Production & Regulating the Supply of Organic Fertilizer, and Paddy & Grains, Organic Foods, Vegetables, Fruits, Chillies, Onion and Potato Cultivation Promoting, Seed Production and Advanced Technology Agriculture	Member
4	Mr. W.M.M.B Weerasekara	Secretary, State Ministry of Provincial Councils & Local Government	Member
5	Dr. Ajantha De Silva	Director General, Department of Agriculture	Member
6	Mr P.M.K. Hettiarachchi	Additional Director General Department of Development Finance	Member

	Members of the TEC		Capacity
1	Mr.Mahesh Gammampila	Additional Secretary (Development), State Ministry of Promoting the Production & Regulating the Supply of Organic Fertilizer, and Paddy & Grains, Organic Foods, Vegetables, Fruits, Chillies, Onion and Potato Cultivation Promoting, Seed Production and Advanced Technology Agriculture	Chairman
2	Ms. P. Malathi	Additional Secretary (Agri Technology), State Ministry of Promoting the Production & Regulating the Supply of Organic Fertilizer, and Paddy & Grains, Organic Foods, Vegetables, Fruits, Chillies, Onion and Potato Cultivation Promoting, Seed Production and Advanced Technology Agriculture	Member
3	Prof.Chandrika Nanayakkara	Professor in Plant Sciences, University of Colombo.	Member
4	Dr.D.M.J.B.Senanayake	Director, Rice Research and Development Institute, Bathalagoda.	Member
5	Dr.M.S.Nijamudeen	Additional Director/ Principal Scientist(Soil Science), Sustainable Agriculture Research and Development Centre, Makandura.	Member
6	Ms.L.M.Pathirage	Chief Accountant, State Ministry of Promoting the Production & Regulating the Supply of Organic Fertilizer, and Paddy & Grains, Organic Foods, Vegetables, Fruits, Chillies, Onion and Potato Cultivation Promoting, Seed Production and Advanced Technology Agriculture	Member
7	Mr. J. M. Herath Banda	Director Department of National Budget	Member

CamScanner

Other Officials in attendance

1. Ms. N.D.C.P. Nakandala – Senior Assistant Secretary, State Ministry of Agriculture
2. Ms Madushika Gunarathne – Assistant Secretary, State Ministry of Agriculture

Procurement of Eco-friendly Locally Manufactured Fertilizer for Paddy Cultivation in Ya Season 2022

1.0 Background

1.1 Bids were called for procurement of Eco-friendly Locally Manufactured Fertilizer f Ya Season 2022 under National Competitive Bidding Procedure to select suitable bidders to supply organ fertilizer for paddy cultivation in Yala Season for an approximate extent of 600,000 hectares estimated by the Department of Agrarian Development. Notices were published on 12.01.2022 in t newspapers of "Dinamina", "Thinakaran" & "Daily News" and the website of the Ministry Agriculture. Bidding documents were approved by the SCAPC on 26.01.2022. Bidding documer were issued to the bidders from 27th January 2022.

1.2 As per the request of State Ministry of Promoting the Production & Regulating the Supply Organic Fertilizer, and Paddy & Grains, Organic Foods, Vegetables, Fruits, Chillies, Onion and Pota Cultivation Promoting, Seed Production and Advanced Technology Agriculture, the Director General Department of Public Finance has appointed a Technical Evaluation Committee comprising fi wi members.

1. Mr. Mahesh Gammampila – Additional Secretary, State Ministry of Agriculture – Chairman
2. Ms. P. Malathy – Additional Secretary, State Ministry of Agriculture – Member
3. Prof. Chandrika Nanayakkara, Professor of Department of Plant Sciences – Member
4. Dr. D.M.J.B. Senanayake - Director, Rice Research and Development Institute – Member
5. Dr M.S. Nijamudeen - Additional Director Sustainable Agriculture Research and Developme Centre Makandura – Member
6. Ms. L.M. Pathirage – Accountant, State Mi y of Agriculture – Member
